## කෙටි කතාව

ඩොරිස් ලෙසින් නම් වූ මේ කෙටිකතාවේ කතුවරිය බ්‍රිතාන්‍ය දෙමපිය යුවලකට දාව උපන්නේ ඉරානයේය. පසුව ඔවිහු මේ දැරියද රැගෙන සිම්බාබ්වේ වල මිලට ගත් විශාල ගොවිපලක පදිංචි වූහ. ඔයැ ටරී සී°සබටසබට යන නමින් එලි දැක්වූ ඇගේ ප්‍රථම නවකතාව බ්‍රිතාන්‍යයේ සහ සෙසු යුරෝපා රටවල බෙහෙවින් ජනප්‍රිය වූ සාර්ථක කෘතියකි. කෙටිකතා හා පුවත් පත් ලිපි රචිකාවක් වශයෙන් ඇය අපරදිග ලෝකයේ ඉමහත් ප්‍රසිද්ධියක් දිනා ගත්තාය. ඇගේ කලා නිර්මාන ගැන විචාරයක යෙදෙන ඔයැ ෂබාැචැබාැබඑ සගරාව පවසන්නේ, ඇය සිය අදහස් ඉදිරිපසටත් පසුපසටත් ගොතමින් අපේ කාලයේ සිදුවීම් පෙල ගසන ආකාරය සමකාලීන ලේඛකයින් ට වඩා දෙගුණයක වටිනාකමින් යුක්ත බවය. මේ ඇගේ ඔයැ ධකා කයසැෙ වීයක්බට් කෙටිකතාවේ අනුවාදයයි.



# උරුමය

අනුවාදය



ඩබ් එච් උපසේන

එක් සන්ධ්‍යාවක මම අපේ තාත්තාගේ ගොවිපල අසලින් වැටී තිබුන අඩි පාරක් ඔස්සේ ගමන් කරමින් සිටියෙමි. රතු පැහැති පස් කැටිති උඩට පෙරැලී තිබුනේ හරියට රතු පැහැති ජල රැලි උඩට එන්නාක් මෙනි. එය බෙහෙවින් කථා බහට සීරුවෙන් සවන් දෙන නිසොල්මන් වේලාවක් විය. කුරුල්ලෝ ගහකින් ගහකට ඉගිලෙමින් ශෝකී ගී රාවයක් ගායනා කළහ. පොලවේ හා ගහකොල වල සියළුම පැහැයන් එකම ගැඹුරු රන් පැහැයකට හැරෙන සන්ධ්‍යාවකි, මේ. මම මගේ තුවක්කුව වැලිමිට නැම්මේ රඳවා ගෙන සිටියෙමි. බල්ලෝ සුපුරුදු පරිදි මගේ පස්සේ වැටී සිටියහ. මා ඉදිරිපසින් සමහර විට යාර දෙසීයයට ඔබ්බෙන් කළු ස්වදේශිකයින් තිදෙනෙකු එමින් සිටියහ. මම තුවක්කුව මානා ගනිමින් බල්ලන් මට කිට්ටුවන මෙන් සන් කළෙමි. මා ලංවත්ම මේ පිරිස මට පාර ඉඩදී පසෙකට වනු ඇතැයි මම බලාපොරොත්තු වීමි. පිරිස එලවා දැමීමට නියෝගයක් බලාපොරොත්තුවෙන් මෙන් බල්ලෝ මගේ මුහුණ බැලූහ. ස්වදේශිකයෙක් මෙලෙස සුදු ජාතිකයකුට මග ඉඩ නොදී සිටීම බෙහෙවින් අශෝභන ක්‍රියාවකි. බොහෝ සුදු ළමෝ මෙසේ තමන්ගේ ඉදිරියට එන කළු මිනිසුන්ට බල්ලන් උසි ගන්නවා පලවා හැර විනෝද වන්නට පුරුදුව සිටියහ. අප බොහෝ දෙනෙක් සිතා ගෙන සිටින්නේ ඔවුන් ඉන්නේ අපට වැඩ කරන්නට පමණක් කියාය. තාත්තාගේ ගොවිපලේ වරින් වර වැඩ ට එන එක දිසාවකට සිට තවත් දිසාවකට සංක්‍රමණය වන කළු මිනිස්සුන් කිසිම හැඩයක් නැති පිරිසක් ලෙසය , මා දුටුවේ. නිවසේ වැඩට යොදවා තිබෙන මෙහෙකාරියන් සියල්ලම පාහේ අතේ දුරින් තබා ගත යුතු විය. ඔවුන් සමග ඕනෑවට වඩා කථා බහට යෑම සපුරා තහනම් ක්‍රියාවකි. අම්මා වහා මැදට පනියි. සැරයටියට සිය සිරුරේ බර හේත්තු කර ගෙන ඉදිරියෙන්ම ආ මහළු මිනිසා ගේ හිස කේ සුදු පැහැ ගැන්වී දිලිසෙමින් තිබුනි. සාටකයක් මෙන් ඔහුගේ උරහිස් මතට වැටී තිබුනේ බ්ලැන්කැට්ටුවකි. ඔහු පිටිපසින් තරුණයින් දෙදෙනෙක් ගමන් කළ අතර ඔවුන් අතර මැටි බඳුන් පොදිය බැගින් විය.

මෙම කණ්ඩායම් මගේ දෙනෙතට එතරම් නුහුරු අය නොවේ. ඔවිහු සංචාරක ස්වදේශිකයින් නොව තම තමන්ගේ වැඩපොලක් කරගෙන අභිමානාත්මකව ජීවත් වන ගෝත්‍රිකයින් පිරිසකි. විශේෂයෙන් මහල්ලාගේ මුහුණේ රැඳි අභිමානය කිසිවක් බිනීමට මා තුල තිබූ වුවමනාව වලක්වා ලීය. මම නිහඬවම ඉදිරියට ගමන් ගත්තෙමි. බල්ලන්ට මෘදුව කථා කරමින් ඔවුන් සන්සුනව තබා ගත්තෙමි. මට තවත් අඩි දහයක් පමණ ලංවූ විට මහළු මිනිසා සිය බ්ලැන්කැට්ටුව තව තවත් පපුවට තද කර ගත්තේය.

, සුභ උදෑසනක් පුංචි කුමාරිහාමි....... ,.එය දවසේ ඕනැම වෙලාවකට සරිලන සුභාසිංසනයක් විය.

, සුභ උදෑසනක්...., මම ද කීවෙමි. , කොහෙද ඕගොල්ලො මේ යන්නෙ? ,මගේ කට හඬේ කිසියම් තරමක සැර පරුෂ කේන්ති ගත් රාවයක් විය.

මහළු මිනිසා ඊළඟට තමන්ගේ භාෂාවෙන් කථා කරන්නට පටන් ගත්තේය. එවිට ඔහු ගේ සහායකයෙක් ඒවා මට පරිවර්ථනය කරන්නට විය. , අර ගඟෙන් එහා පැත්තෙ ඉන්න එයාගෙ සහෝදරයා බලන්නයි, අපේ නායකතුමා මේ යන්නෙ.......,

, නායකතුමා.....,.මම කල්පනා කළෙමි. තාරාතිරමින් එක හා සමාන අයකුසේ මහල්ලා මා අභිමුවේ ක්‍රියා කිරීමේ තේරුම මට වැටහුනේ එවිටය. එය ඇත්තටම සමානතාවය ඉක්මවූවක් විය. ඔහු විනීතභාවයක් දැක්වුවද මගෙන් එබන්දක් පල වූයේ නැත.

මහළු මිනිසා නැවත වරක් කථා කරන්නට පටන් ගත්තේය. හරියටම තමන්ගේ ඇඳුමක් ඇඟලා සිටින කලක මෙන් මිනිසා තමන්ගේ නායකත්වයට උරුමවූ අභිමානය රැකගන සිටියි. මා දෙස බලන මිනිසාගේ දෑස් ඊට ඔබ්බෙන් ගස් පෙලෙන් මායිම් වූ පෙදෙසක් වෙත රැඳෙයි. ඒ මගේ පියාගේ ගොවිපලේ ඉසව්වයි. ,ජෝර්ඩන් ෆාම් එකේ පුංචි කුමාරිහාමි නේද මේ........?,

මම ,ඔව් .... කීවෙමි.

සමහරවිට ,ඔයාගෙ තාත්තට අමතක ඇති ..., ඔහුගේ සහායකයෙක් කථා කරන්නට විය. ,අපේ නායකතුමාට එළුවො සම්බන්ධ ප්‍රශ්නෙකට එහෙ යන්න සිද්ධවුනා. මට මතකයි, ඔයා එතකොට එහෙ හිටිය.....තරුණයා දෑස් සිය දණහිස් මට්ටමට ගෙන සිනා විය.

අපි සැවොම සිනා සුනෙමු.

,ඔයාගෙ නම මොකක්ද? ,මම මහල්ලාගෙන් ඇසුවෙමි.

,මේ අපේ මිස්ලන්ගා නායකතුමා, තරුණයා පිළිතුරු දුන්නේය.

,මම කියන්නං තාත්තට ඕගොල්ලන්ව හම්බ වුනා කියල, මම කීවෙමි.

,තාත්තට මම සුභ පැතුව කියන්න පුංචි කුමාරිහාමි ,මහල්ලා එවිට පිළිතුරු දුන්නේය.

,සුභ උදෑසනක්........, මම විනීතව කියා ඔවුන්ට සුභ පැතුවෙමි. නිතර භාවිතා නොකිරීම නිසා විනීතභාවය ස්වරයට නගා ගැනීම අසීරු බව මට පෙනුනි. මහල්ලා මට ඉදිරියට යාමට මාවත ඉඩ දුන්නේය.

මම ඔවුන් පසු කළෙමි. තුවක්කුව ඉතා විසුළු ලෙස අතේ එල්ලී ඇත. බල්ලෝ ඉව කරමින් ගොරවති. ස්වදේශිකයින්ව සතුන් මෙන් එලවා දමන සෙල්ලම අද කරන්නට නොලැබීම නිසා ඔවුන් නොසන්සුන් වී ඇති සෙයකි.

ඊට ටික කලකට පසු පැරණි දේශ ගවේශකයකුගේ චාරිකා සටහන් පොතක් කියැවූ කල්හි ප්‍රධාන මිස්ලන්ගා ගේ රට යන වගන්තිය මට සොයා ගත හැකි විය. එහි මෙසේද සඳහන් විය,....අපේ ගමනාන්තය වන්නේ මිස්ලන්ගා නායකතුමාගේ රටයි. එය පිහිටා තිබෙන්නේ ගඟට උතුරිනි. සිය රටේ රත්තරන් තිබෙනවාදැයි කියා ගවේශනය කිරීමට ඔහුගේ අවසරය ලබා ගැනීම මෙවර අපේ ගමනේ අරමුණයි.......,

තවත් එක් අවස්ථාවක අප්‍රිකාව පුරා ඇවිදිමින් රත්තරන් සොයා ආකර කණින සුදු ජාතික පිරිසක් අපේ ගොවිපලට ගොඩවැදුනහ. අතීත කාලයේ සිදුවීම් විස්තර කරමින් සිටි ඔවුන් පැවසූ එක් කරුණක් වූයේ මේ ප්‍රදේශය ඒ දිනවල මිස්ලන්ගට අයත් වූ එකක් බවයි. ,...ඒ කාලයෙ එයාගෙ පලාත මේ කඳු වලල්ලෙ ඉඳල අර ඈත ගංගාව දක්ව විසාලයි. අපි හිතන්නෙ වර්ග හැතැප්ම සිය ගාණක් විතර...ඒකයි මේ හරියට මිස්ලන්ගාගෙ රට කියල තවමත් නම දාල තියෙන්නෙ....,.ඔවිහු මේ ප්‍රදේශය හැඳින්වීමට මගේ පියාගේ ගොවිපලේ නම භාවිතා කළේ නැත.

අප්‍රිකාවේ මේ ප්‍රදේශය විදේශිකයින් සඳහා විවෘතවූ සමය, එනම් මීට පනස් වසරකට පෙර අතීතය සම්බන්ධ පොත පත කියවන්නට මම උත්සුක වුනෙමි. එහිදී මට දැන ගන්නට ලැබුනේ, මිස්ලන්ගා ගෝත්‍රික නායකයා එවකට බෙහෙවින් ප්‍රසිද්ධ පුද්ගලයකු වගය. රත්තරන් ආකර කනින්නන් සියළු දෙනාම ඔහුව හඳුනාගෙන සිටියහ. ඒ කාලයේ ඔහු බෙහෙවින් තරුණ පුද්ගලයකුව සිටින්නට ඇත. සමහර විට ඒ දිනවල මේ පදවිය දරා ඇත්තේ ඔහුගේ තාත්තා හෝ වෙනත් වැඩිහිටියකු වන්නටද පුළුවන. කෙසේ වුවත්, හරියටම ඒ ඔහුමද නැත්නම් අන් කවරකුද යන්න සොයා ගැනිමට මම අපොහොසත් වුනෙමි.

රට හරහා වැඩපල සොයා ගමන් කරන ස්වදේශිකයිනට තහනම් වූ අපේ ගොවිපල අසලින් වැටී තිබෙන කුඩා මාවත හරහා ඔහු කිහිපවතාවක් ගමන් කරනු ඉන්පසුවත් දැකගත හැකිවිය. මට ඇත්තටම ඔහුව මුණගැසෙන බලාපොරොත්තුවක් ද විය. ඒ ඔහුගේ ආචාරය පිලිගැනීමට- නැතිනම් ආචාර සමාචාර හුවමාරු කර ගැනීමට ඒ සැමකටත් වඩා මගේ සිතේ හොල්මන් කරන ප්‍රශ්න වලට පිළිතුරු ලබා ගැනිමට.......

මා නොදන්නා භූමි ද්‍රර්ශන පිළිබඳ මතකය කෙමෙන් මැකී ගොස් මගේ දෙපා වඩාත් සවිමත් ලෙස අප්‍රිකානු භූමියේ පිහිටුවා ගන්නට තැත් කළෙමි. මේ කඳුවල හා ගහකොල හැඩරුව ඒ පැහැය හා සුවඳ මට වඩාත් හොඳින් විඳ ගැනීමට මට ඒ අනුව හැකියාව ලැබුනි. කළු මිනිසා පිළබඳ මගේ සිතේ නැතිවී ගොස් තිබුනු උනන්දුව යළිත් සිත තුල පැලපදියම් වී ගෙන ආවේය. එහෙත් මේ බිම හා මේ කළු මිනිසුන් එක්ව රඟන රංගනය මට කිසිදා ග්‍රහණය කර ගත හැකි ද යන්න ප්‍රශ්නයක් විය. කෙසේ වුවද, මෙය මගේද උරුමයයි. කළු මිනිසාගේ මෙන්ම මෙය මගේ ද රටයි. මහපාරේ හා පදික වේදිකාවල වැලිමිටි හරස් කර නොගෙන ජීවත් වීම සඳහා අපි සැමටම මෙහි ඕනෑ තරම් ඉඩකඩ හා අවස්ථා ඇත.

*...අපේ ගමනාන්තය වන්නේ මිස්ලන්ගා නායකතුමාගේ රටයි. එය පිහිටා තිබෙන්නේ ගඟට උතුරිනි. සිය රටේ රත්තරන් තිබෙනවාදැයි කියා ගවේශනය කිරීමට ඔහුගේ අවසරය ලබා ගැනීම මෙවර අපේ ගමනේ අරමුණයි.......,*

එක් දිනක් සුදු පොලිස් භටයෙක් දිස්ත්‍රික්කය පුරා සංචාරය කරන අතර වාරයේ අපේ ගොවිපලටත් ගොඩවැදුනේය. , ඕගොල්ලො දන්නවද බොහොම වැදගත් මිනිහෙක් ඕගොල්ලන්ගෙ කුස්සියෙ වැඩ කරනව කියල? , ඔහුගේ මුහුණේ සෝපාහාස්තමක සිනාවක් විය.

,මොකක්?...,.අම්මා විශ්මයෙන් ඔහු දෙස බැලුවාය.

,මිසලන්ග නායකයගෙ පුතා වැඩ කරන්නෙ ඕගොල්ලන්ගෙ කුස්සියෙ. දැන් ඉන්න මිස්ලන්ග මලාම මිනිහට තමයි, ගෝත්‍රයෙ නායකකම ලැබෙන්නෙ. ඒ කියන්නෙ ඔටුන්න හිමි කුමාරයකුත් ඕගොල්ලො ගාව වැඩ...,

,ලොක්කගෙ පුතා කියල ඒයාට බෑ මට ගණන් දාන්න ,අම්මා එය ට පිළිතුරු වශයෙන් කීවාය.

පොලිස් භටයා නික්ම ගිය පසු අපි අපේ කෝකියා දෙස වඩාත් විමසිල්ලෙන් බැලුවෙමු.

20 වන පිටට